**හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව**
**2020.11.09**

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ ගරු සම සභාපතිවරුන් දෙපලගේ ප්‍රධානත්වයෙන් සහ ගරු මැති ඇමතිතුමන්ලාගේ සහභාගීත්වයෙන් 2020.11.09 වන දින පෙ.ව. 9.30ට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදි.

ප්‍රථමයෙන්ම, ගරු සම සභාපතිවරුන් දෙපල ඇතුළු පැමිණ සිටි සියළුම දේශපාලන නායකත්වය හා රාජ්‍ය නිලධාරීන් හම්බන්තොට දිස්ත්‍රික් ලේකම්වරයා විසින් පිළිගන්නා ලද අතර, පවතින තත්ත්වය සැලකිල්ලට ගනිමින් හැකිතාක් අඩු සංඛ්‍යාවක සහභාගීත්වයෙන් මෙම රැස්වීම පැවැත්වීමට තීරණය කරන ලද බවද ප්‍රකාශ කරන ලදි. විශේෂයෙන්ම සපිරිගමක් සංවර්ධන වැඩසටහන බොහෝවිට නිම වී ඇති අතර ඇතැම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පවතින යම් යම් ගැටළු පිළිබඳව මෙහිදී සාකච්ඡා කර විසඳා ගත යුතු බව ද ප්‍රකාශ කරන ලදි. තව ද, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ දී ඉදිරියට ගෙන යා හැකි විශේෂිත කරුණු පිළිබඳව පමණක් සාකච්ඡා කරන බවත්, අනෙකුත් කරුණු ආයතන මට්ටමින් සම්බන්ධීකරණය වී විසඳාගත යුතු බවත් පෙන්වා දෙන ලද අතර, දිස්ත්‍රික්කයේ බොහෝ සෙයින් පවතින ඉඩම් ගැටළු පිළිබඳව වෙනම සාකච්ඡා කර විසඳා ගත යුතු බවත්, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහනේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී දේශපාලන අධිකාරිය සමඟ සාකච්ඡා කර මනා සම්බන්ධීකරණයකින් සිදු කළ යුතු බවත්, ප්‍රකාශ කරන ලදි. එමෙන්ම, සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය මත ක්‍රියාත්මක කිරීමට යෝජිත ග්‍රාමීය ආර්ථිකය නගාසිටුවීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුව, සමාජීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුව, ජීවනෝපාය සංවර්ධන කමිටුව හා දේශීය නිෂ්පාදන කර්මාන්ත වැඩිදියුණු කිරීමේ සංවර්ධන කමිටුව යන සංවර්ධන කමිටු වලට අදාල මූලික කටයුතු දැනටමත් ආරම්භ කර ඇති බවත් එම කමිටු ස්ථාපනය කර මෙම වැඩසටහන සාර්ථකව දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කරන ලදි. එසේම පවතින කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ විකල්ප ආරෝග්‍ය ශාලා හඳුනාගැනීමේ දී අඟුණකොළපැලැස්ස කෘෂිකර්ම විද්‍යාලය ඒ සඳහා ලබා දී ඇති බවත්, අවශ්‍යතාවයට අදාලව එහි ඉදිකිරීම් කටයුතු ආරක්ෂක අංශ විසින් සිදුකරගෙන යන බවත්, ප්‍රකාශ කරන ලදි. දිස්ත්‍රික්කය තුළ ටොම් ජේ සී අඹ වගාවන්හි මේ දිනවල අස්වනු නෙලමින් සිටින අතර අද දින මත්තල අඹ වගාවේ මුල්ම අස්වැන්නෙන් කොටසක් වාරිමාර්ග ගරු අමාත්‍ය හා අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමණාකරණ ගරු රාජ්‍ය අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමන් වෙත ප්‍රධානය කිරීමට ගොවි මහතුන් කටයුතු කළ බවත් ප්‍රකාශ කරමින් සභාවේ කටයුතු කරගෙන යාම සඳහා ගරු සභාපතිතුමන් වෙත අවස්ථාව ලබාදෙන ලදි.

ෆයිනස් වගාව වෙනුවට පළතුරු වගාව ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව පසුගිය රැස්විමේ දී සාකච්ඡා කල ද එය පසුගිය වාර්තාවේ සටහන් වී නොමැති බවට ගරු පරිසර අමාත්‍යතුමන් විසින් පෙන්වා දෙන ලදි. මේ වන විට ෆයිනස් වගාව ඉවත් කිරීමේ කටයුතු සිදුකරමින් පවතින බවට වාර්තා විය. පසුගිය රැස්වීමේ දී මේ සම්බන්ධයෙන් සාකච්ඡා වූ කරුණු රැස්වීම් වාර්තාවේ අනු අංක 6.2 යටතේ සටහන් වී ඇති බවට අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) විසින් පෙන්වා දෙන ලදි. ඒ අනුව 2020.09.07 දිනැති රැස්වීම් වාර්තාවේ අඩුපාඩු කිසිවක් නොවූ බැවින් එම වාර්තාව සභා සම්මත කරන ලද අතර, අනතුරුව සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| **01** | **2020.09.07 රැස්වීමේ දී සාකච්ඡා කළ ගැටළුවලට අදාල ප්‍රගතිය ඉදිරිපත් කිරීම** | | | |
| 1.1 | තිස්සමහාරාම මාගම විද්‍යාලයේ පන්ති කාමර සහිත ගොඩනැගිල්ලේ දෙවන මහල ඉදිකිරීම | වසර 10ක පමණ කාලයක් තිස්සේ කොන්ක්‍රීට් තට්ටුව අවුවට හා වැස්සට නිරාවරණය වීමෙන් යම් ස්ථානවල කම්බි මල බැඳී ඇති බවත්, ගොඩනැගිල්ලේ කටයුතු අවසන් කිරීමේ දී අලුත්වැඩියාවන් ද සිදුකර ආරක්ෂිත ලෙස භාවිතා කිරීමේ හැකියාවක් පවතින බවත් ඒ සඳහා රු 8,952,000.00ක | අදාල ඇස්තමේන්තුව දකුණු පළාත් සභා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දුනි. | ලේකම්, දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය/ දිස්ත්‍රික් ඉංජිනේරු (ගොඩනැගිලි) / කලාප |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදි. | | අධ්‍යාපන අධ්‍යක්ෂ - හම්බන්තොට |
| 1.2 | බෙරලිහෙල 3 කොළණිය පාසලේ ගොඩනැගිලි ගැටළු | හම්බන්තොට දිස්ත්‍රික්කයේ සංවර්ධනය විය යුතු පාසල් ගොඩනැගිලි පිළිබඳ විස්තර ලබාගැනීමට තීරණය වූ අතර වලස්මුල්ල කලාපයෙන් සංවර්ධනය විය යුතු පාසල් ගොඩනැගිලි 49ක් ද, තංගල්ල කලාපයේ ගොඩනැගිලි 20ක් ද නව ගොඩනැගිලි අවශ්‍යතා 3ක් ද පවතින බවට කරුණු ඉදිරිපත් විය. | එම ගොඩනැගිලි අවශ්‍යතා ලේඛන පළාත් සභාවට යොමු කරන ලෙස උපදෙස් ලබා දුනි. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - හම්බන්තොට, තංගල්ල, වලස්මුල්ල |
| 1.3 | වීරකැටිය ප්‍රාථමික විද්‍යාලයට සිසුන් ඇතුළත් කර ගැනීමේ දී මතු වී ඇති ගැටළු | තිරාවල හා කැප්පිටියාව ප්‍රාථමික විද්‍යාල කණිෂ්ඨ විද්‍යාල තත්ත්වයට වැඩිදියුණු කිරීම හා වීරකැටිය මධ්‍යමහා විද්‍යාලයට ශිෂ්‍යත්වධාරී සිසුන් පමණක් ඇතුළත් කර ගැනීම තුළින් එම ගැටළු නිරාකරණය කර ගත හැකි බවට යෝජනා ඉදිරිපත් කරන ලදි. | ඒ පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබා දුනි. | ලේකම් - දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - වලස්මුල්ල |
| 1.4 | දිස්ත්‍රික්කයේ පවතින ගුරු හිඟය හේතුවෙන් මතු වී ඇති ගැටළු | වලස්මුල්ල කලාපයේ ජාතික පාසල් 4හි ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු 09ක් පවතින බවටත් පළාත් පාසල්වල පුරප්පාඩු 44ක් පවතින බවටත් හම්බන්තොට කලාපයේ ගුරු පුරප්පාඩු 198ක් පවතින බවටත් තාවකාලික අනුයුක්තවීම් මෙසේ පුරප්පාඩු සංඛ්‍යාව වැඩි වීමට හේතු වී ඇති බවටත් ප්‍රකාශ කරන ලදි.<br><br>දිස්ත්‍රික්කය තුළ ඉංග්‍රීසි ගුරුවරුන්ගේ හිඟයක් පවතින බවත් කලාප අතර ගුරු තුලනය නිසි පරිදි සිදු නොවීම හේතුවෙන් අනෙක් විෂයන් සඳහා ගුරු හිඟයක් පෙන්නුම් කරන බවටත් තොරතුරු ඉදිරිපත් විය. එසේම තාවකාලික අනුයුක්තවීම හේතුවෙන් ගුරු පුරප්පාඩු නිසියාකාරව හඳුනාගැනීමේ ගැටළුවක් මතුවන බවත් මින් ඉදිරියට තාවකාලික අනුයුක්ත කිරීම් නතර කිරීම සුදුසු බවටත් කරුණු ඉදිරිපත් විය.<br><br>දෙසැම්බර් මාසය වන විට ගුරුවරු 300ක් බඳවාගැනීමට කටයුතු කරන බැවින් ගුරු පුරප්පාඩු විසඳාගත හැකි බව ගරු ආණ්ඩුකාර තුමා ප්‍රකාශ කරන ලදි.<br>ග්‍රාමීය මට්ටමින් තෝරාගන්නා ලද ප්‍රථමික පාසල්වල පහසුකම් වැඩිදියුනු කිරීමට පියවර ගෙන ඇති බවත්, ඕකෙවෙල හා ලුණුගම්වෙහෙර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවලට ජාතික පාසලක් නොමැති බැවින් ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු විය යුතු බවටත් කරුණු ඉදිරිපත් විය. | පුරප්පාඩු ලේඛන දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දෙන ලදි. | ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>ලේකම් - දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය / කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ - වලස්මුල්ල, තංගල්ල, හම්බනතොට |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 1.5 | අම්බලන්තොට පැරණි බස් නැවතුම්පල ඉවත් කර නවීන බස් නැවතුම්පලක් ඉදිකිරීම | මේ වන විට වැසිකිළි පද්ධතිය තාවකාලිකව භාවිතයට ගන්නා බවත්, ප්‍රාදේශීය සභාවට ස්ථිර වශයෙන් ම පවරා දීම සඳහා අවශ්‍ය මැනුම් නියෝග ඉදිරිපත් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදි. | එම කටයුතු කඩිනම් කිරීමට උපදෙස් ලබා දුනි. | සභාපති - අම්බලන්තොට ප්‍රාදේශීය සභාව / ප්‍රාදේශීය ලේකම් - අම්බලන්තොට |
| 1.6 | ලුණුගම්වෙහෙර බස් නැවතුම්පල සක්‍රීය කිරීම සඳහා ලුණුගම්වෙහෙර නගර සංවර්ධන සැළැස්ම ක්‍රියාත්මක කිරීම | විසල් හම්බන්තොට සංවර්ධන සැලසුම සකස්කරමින් පවතින බවට වාර්තා විය. අදාල සැලසුම් සකස් කිරිම Covid 19 තත්ත්වය මත ප්‍රමාද වූ බවටත් කරුණු ඉදිරිපත් විය. | මෙහි ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සැලැස්ම කඩිනමින් සකස්කර මීලග රැස්වීමට ප්‍රථම ඉදිරිපත් කල හැකි බව නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්රකාශ කිරීමෙන් අනතුරුව ඒ සඳහා එකඟ විය. | නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය |
| 1.7 | සුනාමි අපදාවට ලක්වූවන් සඳහා ලබාදුන් නිවාස සඳහා ඔප්පු ලබා දීම ප්‍රමාද වීම | සුනාමි ආපදාවට සෘජුව ලක්වූ නිවාසලාභීන්ට නිදහස් දීමනාපත්‍ර මේ වන විට ලබා දී අවසන් බවත්, වෙනත් හේතූන් මත මෙම නිවෙස් වල පදිංචි වී ඇති පුද්ගලයන් වෙත නිරවුල් ලියවිල්ලක් නිකුත් කිරීම ගැටළුසහගත බව ප්‍රකාශ විය. | ඉඩම් සම්බන්ධ ගැටළු සාකච්ඡා කිරීම සඳහා වෙනම රැස්වීමක් පැවැත්වීම සුදුසු බවට තීරණය කරන ලදි.<br>මේ පිළිබඳ නිවැරැදි තොරතුරු ලබාගෙන ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ හා ඉඩම් අමාත්‍යාශය මගින් උපදෙස් ලබාගැනීමට තීරණය විය. | අතිරේක දිස්ත්‍රික් ලේකම්/ සියළුම ප්‍රාදේශීය ලේකම්වරු අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන ) |
| 1.8 | මැදමුලන කිංචිගුනේ ප්‍රජා ජල ව්‍යාපෘයේ ගැටළු | මැදමුලන කිංචිගුනේ ප්‍රජා ජල ව්‍යාපෘතිය ජලසම්පාදන මණ්ඩලයට පවරා දීමට අදාල කටයුතු සිදුකරමින් පවතින බවත් එයට අමතරව මූලික කටයුතු අවසන්කර ඇති බරවකුඹුක රුහුණු දිවිසරණ ජල ව්‍යාපෘතිය හා ජඳුර, දෙනිය, පිංගම ප්‍රජා ජල ව්‍යාපෘති ද ජල සම්පාදන මණ්ඩලයට පවරා ගැනීම සුදුසු බවට ද යෝජනා ඉදිරිපත් විය.<br>ප්‍රජා ජල ව්‍යාපෘති ජල සම්පාදන මණ්ඩලයට පවරා දීමට එකඟතාවය ප්‍රකාශ කරන ලදි. | ප්‍රජා ජල ව්‍යාපෘති ජල සම්පාදන මණ්ඩලයට පවරා ගැනීම සුදුසු බැවින් ඒ සඳහා කමිටුවේ අනුමැතිය ලබා දෙන ලදි. | ප්‍රාදේශීය කළමනාකරු - ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය / ස්ථාන භාර නිලධාරී - ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව. |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| **02** | **සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය ඉදිරිපත් කිරීම** | | | |
| 2.1 | සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 සඳහා අනුමත ව්‍යාපෘති 1014න් මේ වන විට ව්‍යාපෘති 724ක වැඩ අවසන් කර ඇති බවත්, භෞතිකව වැඩ ආරම්භ කර නොමැති ව්‍යාපෘති 38ක් පවතින බවත් ප්‍රකාශ කරන ලදි.<br>ඇතැම් ව්‍යාපෘති සංශෝධන හේතුවෙන් ප්‍රමාද වී ඇති අතර ඇතැම් ව්‍යාපෘති ගිවිසුම් අත්සන් කොට වැඩ ආරම්භ නොකරන ලද ඒවා වන බව ද ප්‍රකාශ කරන ලද අතර වැඩ ආරම්භ කිරීමට නොහැකි වීමට බලපාන ලද හේතු සාකච්ඡා කරන ලදි. එසේ වුව ද, එම ගැටළු විසඳාගෙන ව්‍යාපෘති මෙම වසරේදී නිම කිරීමට කටයුතු කරන බවට ප්‍රකාශ කරන ලදි.<br>දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සඳහා වාර්ෂිකව වෙන් කෙරෙන ප්‍රතිපාදන නිසි අයුරින් වියදම් කල යුතු බැවින් ඒ සම්බන්ධයෙන් සියළු දෙනාගේ අවධානය යොමු විය යුතු බවත්, එසේ නොමැති වීමෙන් එම ප්‍රතිපාදන නැවත හරවා යැවීම සිදු නොවිය යුතු බවට සඳහන් කරන ලදි.<br>අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රජා ජල දෙපාර්තමේන්තු මඟින් ඇස්තමේන්තු සකස් නොකරන ලද ප්‍රජා ජල ව්‍යාපෘතිය වෙනුවෙන් වෙනත් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කල බවට කරුණු ඉදිරිපත් විය. | සියළු ව්‍යාපෘති දෙසැම්බර් මාසය වන විට අවසන් කළ යුතු බව තීරණය කරන ලදි.<br>මෙම ව්‍යාපෘතිය අත්‍යාවශ්‍ය ව්‍යාපෘතියක් බැවින් ඉදිරි වසරේ ක්‍රියාත්මක කිරීමට තීරණය කල අතර එය ප්‍රජා ජල දෙපාර්තමේන්තුවට වෙන්වන ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් කලහැකි බවට එකඟවූ බැවින් ඒ අනුව කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදි. | සියළුම ප්‍රාදෙශීය ලේකම්වරුන්<br>ස්ථානභාර නිලධාරී - ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව |
| 2.2 | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන | ව්‍යාපෘති 89ක් සඳහා රු.මි. 80.00ක ප්‍රතිපාදන වෙන් වී ඇති බවත්, ඉන් මේ වන විට ව්‍යාපෘති 52ක් අවසන් කර ඇති බවත්, තවදුරටත් වැඩ ආරම්භ කර නොමැති ව්‍යාපෘති 09ක් පවතින බවටත් ප්‍රකාශ කරන ලදි. | අදාල කරුණු සාකච්ඡා කිරීමෙන් අනතුරුව වැඩ ආරම්භ කර නොමැති ව්‍යාපෘතිවල කටයුතු කඩිනමින් ආරම්භ කර වර්ෂ අවසානය වන විට නිම විය යුතු බවට උපදෙස් ලබා දුනි. | සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් |
| 2.3 | ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීමේ ජාතික වැඩසටහන | සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් බිහිකිරීම සඳහා ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීමේ ආර්ථික වැඩසටහන් ක්‍රියාත්මක වන අතර, සියළුම අමාත්‍යාංශ කමිටු 04ක් ලෙස සංවිධානය කර ඇති බවත්, හම්බන්තොට | සියළුම අංශ විසින් දිස්ත්‍රික්කයේ ප්‍රමුඛ අවශ්‍යතා හා ගැටළු හඳුනාගෙන ඒවා කඩිනමින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දීමට කටයුතු කරන ලෙස | සියළුම ආයතන ප්‍රධානීන් |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | දිස්ත්‍රික්කයේ පවතින ප්‍රධාන සංවර්ධන අවශ්‍යතාවයන් හා අවධානය යොමු කළ යුතු හෝ විසඳීමට අපහසු ගැටළු පිළිබඳව රාජ්‍ය අමාත්‍යාංශවල අවධානය යොමු කිරීම මේ මඟින් අපේක්ෂිත බවත් දන්වන ලදි.<br>ඒ අනුව, සියළුම ගරු මැති ඇමතිවරුන්ගෙන් ප්‍රාදේශීය සභා සභාපතිවරුන්ගෙන් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ද අනෙකුත් සියළුම ආයතන මඟින් ද දිස්ත්‍රික්කයේ හඳුනාගත් ගැටළු හා අවශ්‍යතාවයන් කඩිනමින් ලබා ගැනීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන ලදි. | උපදෙස් ලබා දුනි. | |
| **03** | **ජල සම්පාදන ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 3.1 | ජල සම්පාදන මණ්ඩලයේ ඉදිරි සැළසුම් පිළිබඳව ඉදිරිපත් කිරීම | සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති මාලාව යටතේ සැමට ජලය ලබා දීම යන අරමුණින් ක්‍රියාත්මක 2020-2025 ක්‍රියාකාරී සැලැස්ම අනුව ජාතික වශයෙන් 100% ජල සැපයුමක් සඳහා ජල සම්පාදන මණ්ඩලය විසින් 78.4% ජල සැපයුමක් ලබාදීමට කටයුතු කරන බවත්, ඉතිරිය වෙනත් ව්‍යාපෘති මඟින් සම්පූර්ණ කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදි.<br>මේ වන විට හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජල සම්පාදන ක්‍රම 20ක් යටතේ 61.3%ක ආවරණයක් සිදුවන බවත් 2025 වන විට එය තවත් 32%කින් ඉහළ නැංවීම සඳහා සැළසුම් සකස් කර ඇති බවටත් ප්‍රකාශ කරන ලද අතර එසේ සැලසුම් කරන ලද ව්‍යාපෘති පිළිබඳව කරුණු ඉදිරිපත් කරන ලදි.<br>එම සැළසුම් ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාල, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ආදී විවිධ ආයතනවල පූර්ණ සහයෝගය අවශ්‍ය වන බවත් ප්‍රකාශ කරන ලදි.<br>සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ඊට අදාල සැළසුම් පිළිබඳව ජල සම්පාදන මණ්ඩලය දැනුවත් නොකිරීම හේතුවෙන් ගැටළු ඇතිවන බවට ප්‍රකාශ කරන ලදි.<br>මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ජල ප්‍රභවයන් අයත් ආයතන මඟින් ජලය ලබා දීමට එකඟතාවය ලබා නොදීම හේතුවෙන් ව්‍යාපෘති අනුමත කිරීමේ දී ගැටළු මතුවන බව ප්‍රකාශ කරන ලදි. | ජල සම්පාදන මණ්ඩලයේ සැළසුම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සියළු දෙනාගේ සහාය ලබා දීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන ලද අතර, අදාල ආයතන සමඟ සම්බන්ධීකරණය වී එම ගැටළු විසඳා ගන්නා ලෙසත්, ඒ සඳහා අවශ්‍ය සහාය සම්බන්ධීකරණ කමිටුව මැදිහත් වීමෙන් නිරන්තරයෙන් ලබා දෙන බවටත් ප්‍රකාශ කරන ලදි.<br>අවශ්‍ය වේ නම් මේ පිළිබඳව විශේෂ සාකච්ඡාවක් පවත්වා ඉදිරි කටයුතු කිරීමට තීරණය විය. | ප්‍රාදේශීය කළමනාකරු - ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය / අධ්‍යක්ෂ - වාරිමාර්ග / නේවාසික ව්‍යාපාර කළමණාකරු - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය / පළාත් වාරිමාර්ග ඉංජිනේරු / ප්‍රාදේශීය ලේකම්වරු |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 3.2 | සූරියවැව මහ අලුත්ගම්ආර අවල ප්‍රජාමූල ජල ව්‍යාපෘතියට රුහුණුපුර ජල ව්‍යාපෘතියෙන් තොග ජලය ලබා දීමේ අවශ්‍යතාවය | ජල සම්පාදන මණ්ඩලයට පවරා දීමට තීරණය වී ඇති බවත්, අදාල වැඩි දියුණු කිරීම් සිදුකර එකී කටයුතු සිදුකරන බවට ප්‍රකාශ කරන ලදි. | එම කටයුතු කඩිනම් කිරීමට තීරණය කරන ලදි. | ප්‍රාදේශීය කළමණාකාර, ජලසම්පාදන මණ්ඩලය |
| 3.3 | අඟුණකොළපැලැස්ස ජල ව්‍යාපෘතියේ කටයුතු ප්‍රමාද වීම | අඟුණකොළපැලැස්ස ප්‍රදේශයට හා බන්ධනාගාරයට මෙම ව්‍යාපෘතිය මඟින් ජලය සැපයීමට හැකියාව ඇති බවටත්, එහි ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් ගැටළු මතු වී ඇති බවටත් කරුණු ඉදිරිපත් විය. | ව්‍යාපෘතියේ කටයුතු ප්‍රමාද වීම සම්බන්ධයෙන් වාර්තාවක් කඩිනමින් ලබා දීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය කළමණාකාර, ජලසම්පාදන මණ්ඩලය |
| 3.4 | තිස්ස හා ලුණුගම්වෙහෙර ජල ව්‍යාපෘති සම්බන්ධ ගැටළු | මෙම ව්‍යාපෘතිවල ජල සැපයීම් හා ජලයේ ගුණාත්මකභාවය පිළිබඳව ගැටළු පවතින බවට කරුණු ඉදිරිපත් විය. | එම ජල ව්‍යාපෘති ගැටළු විසඳීම සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දෙන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය කළමනාකරු - ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය |
| 3.5 | බෙලිඅත්ත පැරකුම් ජල ව්‍යාපෘතියේ ගැටළු | සමිතියේ මුදල් වලින් ප්‍රජා ජල ව්‍යාපෘතියේ ඇතැම් වැඩ කටයුතු සිදු කළ ද මෙම ජල ව්‍යාපෘතිය සඳහා දකුණු පළාත් සභාවෙන් ලබාදී ඇති රුපියල් ලක්ෂ 44 ක මුදල ප්‍රජා ජල දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයෙන් මේ දක්වා ලබා නොදීම නිසා ඉතිරි වැඩ කොටස් සිදුකිරීම ප්‍රමාද වී ඇති බවට කරුණු ඉදිරිපත් විය. | මේ සම්බන්ධයෙන් පවතින ගැටළු පිළිබඳව සොයා බලා ව්‍යාපෘතියේ කටයුතු අවසන් කරන ලෙස උපදෙස් ලබා දුනි. | ස්ථාන භාර නිලධාරී - ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව |
| 3.6 | මහගල්වැවට රුහුණු පුර ජල ව්‍යාපෘතියෙන් ජලය ලබා ගැනීම | රුහුණු පුර ජල ව්‍යාපෘතියේ පළමු අදියර පමණක් මේ වන විට ක්‍රියාත්මක වන අතර, එම ප්‍රදේශය උසින් පිහිටීම හේතුවෙන් ජලය සැපයීමේ අපහසුතාවයක් පවතින බවටත්, දෙවන අදියර ක්‍රියාත්මක වීමේ දී එම ගැටළුව විසඳිය හැකි බවටත් කරුණු ඉදිරිපත් විය. | මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය කළමනාකරු - ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය / ස්ථාන භාර නිලධාරී - ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව |
| **04** | **ඉඩම් ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 4.1 | යෝජිත කර්මාන්ත කලාපය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් මතු වී ඇති ගැටළු | කර්මාන්ත කලාප ව්‍යාපෘතියක් සඳහා ලියන්ගස්තොට ප්‍රදේශයේ ඉඩම් හෙක්ටයාර 637ක් පමණ හඳුනාගෙන ඇති බැවින්, එහි මායිම් දැක්වෙන නිශ්චිත භූමි සැලැස්මක් නොතිබීම හේතුවෙන් නිෂ්චිත මායිම් හඳුනා ගැනීමේ ගැටළුවක් පවතින බවටත්, | මේ සම්බන්ධයෙන් ඉඩම් අමාත්‍යාංශ ලේකම් හා කැබිනට් ලේකම් දැනුවත් කරන ලෙසත්, මේ වන විට එම ඉඩම භුක්තිවිඳින අයගේ ලේඛනයක් කඩිනමින් | ප්‍රාදේශීය ලේකම් - අම්බලන්තොට |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| | | දැනට වසර 2ක පමණ කාලයක සිට උක්ත කාර්යයෙහි ඉදිරි ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවටත්, එවැනි තත්ත්වයක් මත මෙම භූමියෙහි පදිංචිකරුවන් සඳහා බලපත්‍ර ලබා දීම, වගා කටයුතු කිරීම හා ගල්කොරි පවත්වාගෙන යාම ආදිය සඳහා අවසර ලබා දීමේ හැකියාව පිළිබඳ ගැටළු පැවති බවට කරුණු ඉදිරිපත් විය.<br>මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල යෝජනාවක් ද පවතින බැවින් එම භූමිය නිශ්චිත වශයෙන් එකී කාර්ය සඳහා යොදා ගන්නේද එසේ නොමැති නම් ඉදිරි සංවර්ධන කටයුතු සඳහා යොදා ගන්නේ ද යන්න පිළිබඳව ගැටළු මතු වී ඇති බවට ප්‍රකාශ කරන ලදි. | ඉදිරිපත් කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | |
| 4.2 | හම්බන්තොට වරාය ඉදිකිරීම නිසා තිස්ස - කතරගම මාර්ගය වැසී යාම හේතුවෙන් ව්‍යාපාර අහිමිවූවන්ට විකල්ප ඉඩම් ලබා දීම | මේ සඳහා හඳුනාගත් ඉඩමක් පවතින බවටත්, නාගරික සංවර්ධන අධිකාරියේ ක්‍රමවේදය අනුව එම ඉඩම ලබා දීමේදී ගැටළුව පවතින බවටත්, අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව ලබා දීමේ හැකියාවක් පවතින බවටත් කරුණු ඉදිරිපත් විය. තව ද, මොවුන් සඳහා විකල්ප ඉඩම් කොටසක් ලබා දීම සුදුසු බව දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුවේ දී ද තීරණය වී ඇති බවට ප්‍රකාශ විය. | ව්‍යාපාර අහිමිවූවන්ට ඉඩම් කොටසක් ලබා දීම සුදුසු බවත්, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වන්නේ නම් ඊට අදාල කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. | නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය |
| 4.3 | සූරියවැව කොට්ඨාශයෙන් යෝජිත ජාතික කර්මාන්ත පුහුණු ආයතනය සඳහා ඉඩමක් වෙන් කර ගැනීම | සූරියවැව ප්‍රදේශයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් අක්කර 10ක භූමියක් මේ සඳහා හඳුනාගෙන ඇති බවත්, මේ සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර ඇති බවත් ප්‍රකාශ කරන ලදි. | ඒ පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. | නියෝජ්‍ය අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය / නියෝජ්‍ය අධ්‍යක්ෂ - කාර්මික සංවර්ධන මණ්ඩලය |
| 4.4 | ගරු සම්බන්ධීකරණ කමිටු සම සභාපති තුමා මඟින් Boswin ආයතනය විසින් කෘෂිකාර්මික නිෂ්පාදන සංවර්ධන හා සැකසුම් මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහා ඉඩමක් ඉල්ලීම | ව්‍යාපෘති වාර්තාව අනුව මේ සඳහා අක්කර 20ක භූමියක් අවශ්‍ය වන බවටත්, මයුරපුර උස්ගල ප්‍රදේශයේ ඉඩමක් හඳුනාගෙන අති බවටත්, වන අලි ගැටළුව හේතුවෙන් එම ඉඩම ලබාදීම සම්බන්ධයෙන් අවසන් තීරණයකට පැමිණිය නොහැකි බවටත් කරුණු ඉදිරිපත් විය. | ව්‍යාපෘති වාර්තා අධ්‍යයනය කර ඉඩම් ලබාදීම පිළිබඳ නීත්‍යානුකූලව කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | නේවාසික ව්‍යාපාර කළමනාකරු - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 4.5 | ගරු සම්බන්ධීකරණ කමිටු සම සභාපති තුමා මගින් ඉදිරිපත් කරන ලද යොජිත ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය සහ ඖෂධ නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා ඉඩමක් වෙන් කර ගැනීම | අම්බලන්තොට දෙනිය ආයුර්වේද මධ්‍යස්ථානය මේ සඳහා සුදුසු බවට යෝජනා වුව ද එහි භූමි ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බැවින් සූරිය වැව ප්‍රදේශයේ අක්කර 20ක භූමිය සුදුසු බවට අදහස් ඉදිරිපත් විය. | ව්‍යාපෘති වාර්තා අධ්‍යයනය කර ඉඩම් ලබාදීම පිළිබඳ නීත්‍යානුකූලව කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | නේවාසික ව්‍යාපාර කළමනාකරු - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය |
| 4.6 | සංවර්ධන කටයුතු සඳහා යොදාගත හැකි මත්තල ගුවන්තොටුපල ආශ්‍රිත ඉඩම් සඳහා ප්‍රකාශිත ඔප්පු ලියාපදිංචි කිරීමේ ගැටළුව | මෙම ඉඩම් කොටස් රජයේ අවශ්‍යතා සඳහා යොදා ගැනීමට යාමේදී විවිධ පුද්ගලයන් විසින් ප්‍රකාශන ඔප්පු ඉදිරිපත් කිරීම නිසා ගැටළු මතුවන බවත් මෙම ප්‍රකාශන ඔප්පු ලියාපදිංචි කිරීමේදී අදාල අංශ වලින් තොරතුරු ලබා ගෙන තහවුරු කිරීම නොකරන බැවින් ඉඩම් පරිහරණයේදී නීත්‍යානුකූලභාවය පිළිබඳ ගැටළු මතුවන බව සාකච්ඡා විය.<br>එසේම, මේ වන විට නින්දගම් හිමියන් ලෙස කිසිවෙකුට අයිතිය ඉදිරිපත් කිරීමට හැකියාවක් නොමැති බව ප්‍රකාශ විය. | අදාල ආයතන මගින් ඉඩම් වෙන් කිරීමේ දී නගර සැලසුම් කලාප, වනජීවී කලාප, වන අලි කළමනාකරණ කලාප ආදිය නිසි පරිදි වෙන් කර පවරා දීම් සිදු කළ යුතු බවටත්, එම ආයතන නිසි සම්බන්ධීකරණයකින් යුතුව කටයුතු කළ යුතු බවටත් උපදෙස් ලබා දුනි.<br>ඉඩම් අංශයේ ඉහළ නිලධාරීන් සමඟ සාකච්ඡා කර අවශ්‍ය තීරණ ගැනීම සුදුසු බවට තීරණය කරන ලදි. | අතිරේක දිස්ත්‍රික් ලේකම්/ ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට / නේවාසික ව්‍යාපාර කලමනාකරු - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය/ නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය |
| 4.7 | කසාගල ජන උදාන ගම්මානයේ නිවාසලාභීන් සඳහා ඔප්පු ලබා නොදීමේ ගැටළුව | කසාගල ජන උදාන ගම්මානයේ දීර්ඝ කාලයක සිට පදිංචි වී සිටින පදිංචිකරුවන් සඳහා නීත්‍යානුකූල ඔප්පු ලබා නොදීම හේතුවෙන් එම පිරිස් අපහසුතාවයට පත් වී ඇති බවට කරුණු ඉදිරිපත් විය.<br>අදාල මැනුම් නියෝග ඉදිරිපත් කර ඇති බවත් ඉන් අනතුරුව ඔප්පු ලබා දීමේ හැකියාවක් පවතින බවටත් කරුණු ඉදිරිපත් විය. | මේ පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු කඩිනම් කිරීමට උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - අඟුණකොළ පැලැස්ස / දිස්ත්‍රික් කළමනාකරු - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය |
| 4.8 | කජු සංස්ථාව සඳහා අක්කර 10 ක බිම් කොටසක් ලබාදීම | හම්බන්තොට වරාය ඉදිකිරීම් කටයුතු සඳහා කජු සංස්ථාවට අයත් අක්කර 10 පවරාගැනීම හේතුවෙන් එම බිම් ප්‍රමාණය තිස්සමහාරාමයේ ක්‍රීඩාපිටියක් සඳහා වෙන් කර ඇති භූමියෙන් ලබාදීමට අදහස් ඉදිරිපත් විය.<br>එම භූමිය ක්‍රීඩා පිටියක් සඳහා වඩාත් | දිස්ත්‍රික්කයේ කජු නිෂ්පාදනය සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දෙන ලෙසත්, අක්කර 10ක භූමි ප්‍රදේශයක් භාවිතා කරන ආකාරය | ප්‍රාදේශීය කළමනාකරු - ශ්‍රී ලංකා කජු සංස්ථාව |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | සුදුසු බැවින් වෙනත් ස්ථානයකින් ලබා දීම සුදුසු බවට අදහස් ඉදිරිපත් විය. | සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දෙන ලෙසත් උපදෙස් ලබා දුනි. | |
| 4.9 | බිම්මල් වගාව හා නයි මිරිස් වගාව සඳහා ඉඩමක් වෙන් කර ගැනීම | බිංකම මැදආර නුවන් ප්‍රියංකර මහතා විසින් මේ සම්බන්ධ ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර, අඟුණකොළපැලැස්ස බිංකම ප්‍රදේශයේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් අක්කර 01ක භූමියක් මේ සඳහා හඳුනාගෙන ඇති බවට දන්වන ලදි. | මේ සම්බන්ධයෙන් අවශ්‍ය නීත්‍යානුකූල කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබා දුනි. | නේවාසික ව්‍යාපාර කළමනාකරු - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය |
| **05** | **නගර සංවර්ධන ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 5.1 | හම්බන්තොට මහ රෝහල ඉදිරිපිට අනවසර වෙළඳ කුටි පවත්වාගෙන යාම හේතුවෙන් මතු වී ඇති ගැටළු | නව හෝහල ඉදිරිපිට අනවසර වෙළඳ කුටි පවත්වාගෙන යාම හේතුවෙන් රෝහල ප්‍රවේශ මාර්ගයට ද බාධා එල්ලවන බවටත්, වෙනත් සෞඛ්‍ය ගැටළු මතු වී ඇති බවටත් කරුණු ඉදිරිපත් විය.<br>දිස්ත්‍රික්කයේ විවිධ ස්ථානවල මෙවැනි ගැටළු පවතින බවට ද කරුණු ඉදිරිපත් කරන ලදි. | ඉදිරියේ දී සංවර්ධනය වීමට නියමිත රෝහල් චතුරස්‍රයේ නව වෙළඳ කුටි සංකීර්ණය ඉදිවීමෙන් මෙම ගැටළු විසඳෙන බවට ප්‍රකාශ කරන ලදි. | නාගරික කොමසාරිස් - හම්බන්තොට / නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය / දිස්ත්‍රික් ඉංජිනේරු - මාර්ග සංවර්ධන අධිකාරිය |
| 5.2 | තිස්සමහාරාම ප්‍රධාන මාර්ගය දෙපස බඩ ඉරිඟු වෙළඳාම් කිරීම | එම වෙළඳුන් සඳහා ජංගම වෙළඳ කුටි ලබා දීම සුදුසු බවට කරුණු ඉදිරිපත් විය. | මෙවැනි ගැටළු සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය හා ප්‍රාදේශීය සභා සභාපතිවරුන් සාකච්ඡා කොට තීරණයක් ගැනීම සුදුසු බවට තීරණය කරන ලදි. | සියළුම ප්‍රාදේශීය සභා සභාපතිවරුන් / නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය / දිස්ත්‍රික් ඉංජිනේරු - මාර්ග සංවර්ධන අධිකාරිය |
| 5.3 | පරිසර හිතකාමී දැන්වීම් මාර්ග දෙපස ප්‍රදර්ශනය කිරිම | නගර අලංකරණය සඳහා අත්වැලක් ලෙස පරිසර හිතකාමී පුවරු මාර්ග දෙපස ප්‍රදර්ශනය කිරීමේ ව්‍යාපෘති වාර්තාවක් Good Vision Eco Intergrated (Pvt) Ltd ආයතනය විසින් නාගරික සංවර්ධන හා ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති බවටත්කරුණු ඉදිරිපත් විය. | ප්‍රාදේශීය සභා සභාපතිවරුන් අදාල ආයතන සමඟ සම්බන්ධීකරනය වී එම කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | නගරාධිපති - හම්බන්තොට, සභාපති තංගල්ල නගරසභාව / සියළුම ප්‍රාදේශීය සභා සභාපතිවරුන් |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| **06** | **වනජීවී හා වන සංරක්ෂණ ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 6.1 | ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ බොරළු මාර්ග නඩත්තු කිරීම සඳහා විල්මැන්න බොරළු වල අභය භූමියෙන් නිදහස් කර ගැනීම | විල්මැන්න බොරළු වලෙන් බොරළු ලබා ගැනීමට පෙර අවස්ථාව ලබා දී තිබුණ ද මේ වන විට බොරළු ලබා ගැනීමට බාධා එල්ල වී ඇති බවට කරුණු ඉදිරිපත් විය.<br>විල්මැන්න වෙනුවට විකල්ප ලෙසින් ඌරණිය ප්‍රදේශයේ ස්ථානයක් ඒ සඳහා වෙන් කර ඇති බවත්, විල්මැන්නෙන් බොරළු ලබා ගැනීම සඳහා වනජීවී අධ්‍යක්ෂ ජනරාල්ගෙන් අවසර ලබා ගත යුතු බවත් ප්‍රකාශ කරන ලදි.<br>එම ස්ථානය තිස්ස ප්‍රාදේශීය සභාවට සුදුසු වුව ද ලුණුගම්වෙහෙර සඳහා දුර වැඩි බවට කරුණු ඉදිරිපත් විය. | විල්මැන්න බොරළු වලෙන් බොරළු ලබා ගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් ස්ථානීය පරීක්ෂාවක් සිදුකර වාර්තාවක් කඩිනමින් ලබා දීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | සභාපති - ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව/ සහකාර අධ්‍යක්ෂ (වනජීවී) |
| **07** | **කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 7.1 | සේරුංකෙලිය වැව ආශ්‍රිතව ඇති ඉඩම්වල ගොවිතැන් කටයුතු කිරීම සඳහා අවස්ථාව ලබා ගැනීම | බඳගිරිය කැලියවැලැන ගොවි සංවිධානය මඟින් පැරණි වැව ප්‍රතිසංස්කරණය කර කාලයක් ගතවී ඇති බවටත්, මේ වන විට වැව ජලයෙන් පිරී ඇති නමුත් ගොවිතැන් කටයුතු සඳහා ගොවීන්ට අවස්ථාවක් නොමැති බවටත් කරුණු ඉදිරිපත් කර ඇත. | මේ සම්බන්ධයෙන් සොයා බලා ගොවිතැන් කටයුතු සඳහා අවශ්‍ය සහාය ගොවීන්ට ලබා දෙන ලෙස උපදෙස් ලබා දුනි. | දිසාවන නිලධාරී - හම්බන්තොට |
| **08** | **වාරිමාර්ග ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 8.1 | සූරියවැව HT 28 වැව් රක්ෂිතයේ නිවාස ඉදිකිරීම හේතුවෙන් වැව් රක්ෂිතයට හානි සිදු වීම | වැව් රක්ෂිතයේ පවත්වාගෙන යන විවිධ ඉදිකිරීම් හා ක්‍රියාකාරිත්වයන් හේතුවෙන් රක්ෂිතයට හානි වී ඇති බවට පුබුදු ගොවි සංවිධානය පෙන්වා දී ඇති බව ප්‍රකාශ කරන ලදි.<br>වැව් රක්ෂිතයට මීටර 100ක් ඈතින් නිවාස ව්‍යාපෘතියක් සඳහා මූලික කටුයුතු ආරම්භ කර ඇති බවටත්, වැව් රක්ෂිතයට ඉන් හානියක් සිදු නොවන බවටත් කරුණු ඉදිරිපත් විය. | පුබුදු ගොවි සංවිධානය සමඟ සාකච්ඡා කොට එම ගැටළුව විසඳා ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | නේවාසික ව්‍යාපාර කළමනාකරු - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය. |
| 8.2 | රිදියගම පොකුණුවිල වැව් බස්නාව හරස් වීම හේතුවෙන් ගොඩගම ධම්මාවාස පාරේ පාලම ඉවුර සමඟ ගිලා බැසීම | පාලම ගිලා බැසීම හේතුවෙන් අවධානම් තත්ත්වයක් මතු වී ඇති බවටත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති නමුත් එම මුදල ප්‍රාදේශීය සභාවට වැය කිරීමට හැකියාවක් නොමැති බවටත් කරුණු ඉදිරිපත් විය. | පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතියට හා පළාත් සභාවට ඇස්තමේන්තු ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුනි. | සභාපති - අම්බලන්තොට ප්‍රාදේශීය සභාව / පළාත් වාරිමාර්ග ඉංජිනේරු - හම්බන්තොට |
| 8.3 | හම්බන්තොට කැටන්වැවට ස්ථිර ජල මාර්ගයක් ලබා ගැනීමේ අවශ්‍යතාවය | වලව පද්ධතියෙන් මේ සඳහා ජලය ලබා දීමේ හැකියාව අවම මට්ටමක පවතින බවත්, ජලය ලබා දීම සඳහා කි.මී.2ක පමණ ඇලක් වන ආවරණ කලාපයක් මැදින් ඉදිකිරීමේ දී ගැටළු මතුවන බවත් පෙන්වා දෙන ලදි. | ජලය ලබා දීමට ඇති හැකියාව පිළිබඳව තව දුරටත් සොයා බලන ලෙස උපදෙස් ලබා දුනි. | වාරිමාර්ග අධ්‍යක්ෂ - හම්බන්තොට |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| **09** | **සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 9.1 | හම්බන්තොට පැරණි රෝහල විශේෂිත ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම | ලෝක බැංකු ව්‍යාපෘතියක් මගින් පැරණි රෝහල Covid 19 ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා අදාල ඇස්තමේන්තු සකස් කර ඇති බවටත්, මේ වන විට ප්‍රාථමික ප්‍රතිකාර ඒකකය සඳහා මිලියන 04ක පමණ භාණ්ඩ ලැබී ඇති බවටත්, දෙසැම්බර් මාසය වන විට එම කටයුතු අවසන් කළ හැකි බවටත් කරුණු ඉදිරිපත් විය. | එම කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ - කොවිඩ් 19 විශේෂ ප්‍රතිකාර ඒකකය /සේනාංකාධිප ති - 12 වන සේනාංකය |
| 9.2 | කොවිඩ් 19 වසංගතය ව්‍යාප්ත වීම සම්බන්ධ දිස්ත්‍රික්කයේ වර්තමාන තත්ත්වය පිළිබඳව දැනුවත් කිරීම | මේ වන විට හම්බන්තොටින් රෝගීන් 9ක්, තංගල්ලෙන් 6ක්, අම්බලන්තොටින් 2ක් තිස්සමහාරාමයෙන් 2ක්, සූරියවැවින් 1ක් හා බෙලිඅත්තෙන් 1ක් ලෙස සමස්ථ රෝගීන් 21ක් දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති බවටත්, පවුල් 403ක පුද්ගලයින් 815ක් නිරෝධායනයට යොමු කර ඇති බවටත්, PCR පරීක්ෂණ 4957ක් සිදු කර ඇති බවටත්, කරුණු ඉදිරිපත් කරන ලදි.<br>රෝගීන් යැයි සැක කරන අය සඳහා අම්බලන්තොට රෝහලේ වාට්ටුවක් පිළිසකර කර ඇති බවටත්, එහි PCR සාම්පල ලබා ගැනීමේ ඒකකයක් ස්ථාපිත කර ඇති බවටත්, අඟුණකොළපැලැස්ස කෘෂිකර්ම විද්‍යාලය අතරමැදි ප්‍රතිකාර ඒකකයක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බවත්, එහි ආහාර පිළියෙල කර දීම හමුදා අංශ විසින් භාර ගෙන ඇති බවටත්, මේ සඳහා අවශ්‍ය ඇස්තමේන්තු මේ වන විට සකස් කර ඇති බවටත් ප්‍රකාශ විය.<br>මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ, ග්‍රාම නිලධාරීවරුන්ගේ සහාය ඇතිව සායනික රෝගීන් සඳහා අවශ්‍ය ඖෂධ නිවසටම ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවට ද කරුණු ඉදිරිපත් කරන ලදි.<br>ආසාධිත කසල කිසිවිටකත් ප්‍රමිතියෙන් තොරව බැහැර කිරීමක් සිදු නොකරන බැවින් අනවශ්‍ය බියක් ඇති කර නොගතයුතු බව ද එම කසල නිසි අයුරින් බැහැර කිරීම සිදු කරන බව ද ප්‍රකාශ කරන ලදි.<br>වසංගත තත්ත්වයේ ස්වභාවය වෙන්වීම්වලට ලක්වී ඇති බැවින් සියළුම දෙනා නිසි අවබෝධයෙන් හා නිසි | සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව කටයුතු කරමින් වසංගත තත්ත්වය මර්ධනය කිරීම සඳහා සියළුම දෙනාගේ සහයෝගය ලබා දෙන ලෙස උපදෙස් ලබා දෙන ලදි. | සියළුම ආයතන ප්‍රධානීන් |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් කටයුතු කිරීමට බලා ගත යුතු බවත්, වසංගත තත්ත්වය මර්ධනය කර ගැනීම සඳහා සියළු දෙනාම සහයෝගීව කටයුතු කිරීම ඉතා අවශ්‍ය වන බවත් පෙන්වා දෙන ලදි. | | |
| 9.3 | රෝහල්වල හාඟීර රෝගීන් සඳහා ඇති රැඳී සිටීමේ ස්ථානවල ඉඩ ප්‍රමාණවත් නොවීම | රැඳී සිටීමේ ස්ථානවල ඉඩ පහසුකම් ඇති කිරීම සඳහා ටෙන්ට් ආවරණ ඉදිකිරීම සුදුසු බවත්, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගත යුතු බවත් ප්‍රකාශ කරන ලදි. | අවශ්‍ය ප්‍රතිපාදන පළාත් සභාවෙන් ලබා ගැනීමට තීරණය විය.<br>වසර දෙකක් සඳහා භාවිතා කළ හැකි ප්‍රමිතියෙන් යුතුව එක් එක් රෝහල්වල අවශ්‍යතාවයට ගැලපෙන පරිදි ටෙන්ට් ආවරණ සකස් කිරීම සුදුසු බව තීරණය කරන ලදි. | සියළුම ප්‍රාදේශීය සභා සභාපතිවරුන් / දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |
| **10** | අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගැටළු | | | |
| 10.1 | තිස්සමහාරාම යටාලතිස්ස ප්‍රාථමික විද්‍යාලයට වරාකනත්ත ප්‍රදේශයේ පර්චස් 400ක ඉඩම ලබා ගැනීම | පෞද්ගලික හිමිකරුවකු මෙම ඉඩම ලබා දීමට කැමැත්ත ප්‍රකාශ තිබූ බවත් මේ වන විට ඔහු මියගොස් ඇති අතර ඔහුගේ පුතා ද ඒ සඳහා කැමැත්ත පල කර ඇති බවත් ප්‍රකාශ කරන ලදි. | අදාල පාර්ශවයන් සමඟ සාකච්ඡා කර ඉදිරි කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබා දුනි. | ලේකම් - දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - හම්බන්තොට |
| 10.2 | බෙලිඅත්ත වහරක්ගොඩ පාසල තරුණසේවා සභාවට පවරා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම | වසා දමා ඇති මෙම පාසල ජාතික තරුණ සේවා සභාවට පවරා ගැනීමට ඉල්ලීම් ඉදිරිපත් විය. | ඒ සඳහා කමිටුවේ එකඟතාවය ලබා දෙන ලද අතර නීත්‍යානුලව අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස උපදෙස් දෙන ලදි. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - තංගල්ල / සහකාර අධ්‍යක්ෂ - ජාතික තරුණ සේවා සභාව |
| 10.3 | අඟුණකොළපැලැස්ස ප්‍රාථමික විද්‍යාලයට පන්ති කාමරයක් වැඩිකර ගැනීම | පළමු වසරට ඇතුලත් කිරීම සඳහා වෙනත් කිසිඳු පාසලකට ලකුණු අඩු නොවන සුදුසුකම් ලත් සිසුන් 182ක් සිටින බවත්, පාසලට ඇතුලත් කර ගැනීමට පහසුකම් ඇත්තේ සිසුන් 150කට බවත් ප්‍රකාශ කරන ලදි අතර, එමනිසා පන්ති කාමරයක් වැඩි කර දරුවන්ට අවස්ථාව ලබා දිය යුතු බවට යෝජනා ඉදිරිපත් විය. | අදාල තොරතුරු ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරීමට තීරණය කරන ලදි. | සභාපති - අඟුණකොළ පැලැස්ස ප්‍රාදේශීය සභාව / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - තංගල්ල |
| 10.4 | මොරකැටිආර පාසලේ ගොඩනැගිල්ලක | පාසලේ ප්‍රධාන ශාලාවක වහලය මෙසේ අබලන් වී ඇති බැවින් අනතුරුදායක තත්ත්වයක් පවතින බවට කරුණු | මේ සඳහා පළාත් සභාවේ අරමුදල් වෙන් කිරීම සම්බන්ධයෙන් | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| | වහලය අබලන් වීම | ඉදිරිපත් විය. | අවධානය යොමු කරන ලෙස උපදෙස් ලබා දුනි. | තංගල්ල |
| **11** | **සමාජ සේවා ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 11.1 | සිසිලසගම සමාජ නියාමක සංවර්ධන පදනම (ගැරන්ටි ) ලිමිටඩ් ආයතනය තුළ සිදුවන මූල්‍ය අවභාවිතය සම්බන්ධ ගැටළු | මෙම ආයතනයට විවිධ ප්‍රභවයන් මඟින් ලැබී ඇති මුදල් සහ පවතින මුදල් අවභාවිතා වන බවත් මේ සම්බන්ධයෙන් සොයා බැලීමක් සිදුකිරීම සුදුසු බවටත් යෝජනා විය. ඒ සම්බන්ධයෙන් රාජ්‍ය නොවන සංවිධාන අංශය මඟින් මේ වන විටත් පරීක්ෂා කරමින් පවතින බවට වාර්තා විය. | මේ පිළිබඳ සියළු තොරතුරු ඇතුළත් වාර්තාවක් කඩිනමින් ලබා දීමට තීරණය විය. | සංවර්ධන සහකාර, රාජ්‍ය නොවන සංවිධාන මෙහෙයුම් ඒකකය |
| 11.2 | නිරෝධායනය වන පවුල් සඳහා ආධාර ලබා දීම | නිරෝධායනය වන පවුල් සඳහා රු. 10,000.00 ක ආහාර ද්‍රව්‍ය රු. 5000.00 කොටස් ලෙස අවස්ථා දෙකකදී එක් පවුලකට ලබා දීමට කටයුතු කර ඇති බවත්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගෙන් ලබා ගන්නා තොරතුරු අනුව එම භාණ්ඩ ලබා දීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කරන ලදි. | ඒ සඳහා අදාල අංශ අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස උපදෙස් ලබා දුනි. | සියළුම ප්‍රාදේශීය ලේකම්වරු / සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරුන් |
| **12** | **පරිසර ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 12.1 | වැලි ප්‍රවාහනය කිරීමේ දී ප්‍රාදේශීය සභාවෙන් නිර්දේශ ලබා නොගැනීම නිසා මතු වී ඇති ගැටළු | වැලි කැනීම් ස්ථානයේ සිට ගබඩාව තෙක් ප්‍රවාහනයේ දී අදාල නිර්දේශ ලබා ගැනීමකින් තොරව ප්‍රවාහන කටයුතු සිදු කෙරෙන බවත්, එම නිසා මාර්ගවලට හානි සිදුවීම මෙන්ම ප්‍රාදේශීය සභාවට ලැබෙන අදායම අහිමි වී ඇති බවත්, ගමනාගමනයට අපහසුතා ඇති වී ඇති බවත් ප්‍රකාශ කරන ලද අතර, කැනීම් ස්ථානයේ සිට ගබඩාව තෙක් ප්‍රවාහනය කිරීමේ දී ප්‍රාදේශීය සභාවේ නිර්දේශය ලබාගෙන බලපත්‍ර ලබා දෙන ලෙසට යෝජනා විය. | එක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයකට පමණක් සීමා කර එවැනි අනුමැතියන් ලබා දීමේ හැකියාවක් නොමැති බැවින් සහ පස් හා ගල් සඳහා ද ජාතික මට්ටමේ තීරණයක් ගැනීමට අවශ්‍ය බැවින් මෙම ගැටළුව යෝජනාවක් ලෙස පරිසර අමාත්‍යතුමන්ට ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුනි. | සභාපති - අම්බලන්තොට ප්‍රාදේශීය සභාව/ සහකාර අධ්‍යක්ෂ - මධ්‍යම පරිසර අධිකාරිය/ කැනීම් ඉංජිනේරු - භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය |
| 12.2 | කිරිඳි ඔයේ අනවසර වැලි ගොඩ දැමීම හේතුවෙන් මතු වී ඇති ගැටළු | මේ වන විට බලපත්‍ර ලබාදීම, අලුත් කිරීම හෝ දීර්ඝ කිරීම නතර කර ඇති බවත්, එසේ වුව ද තවදුරටත් වැලි ගොඩදැමීම් සිදුවන බවත් දන්වන ලදි. තව ද ගැඹුරු නළ ලිං කැනීම් කර වැලි සේදීම සිදුකරන බවට ද තොරතුරු ඉදිරිපත් විය. | වැලි සඳහා බලපත්‍ර ලබා දීම නතර කරන ලද දිනය සහ තවදුරටත් ක්‍රියාත්මක වන බලපත්‍ර පිළිබඳව විස්තරයක් ලබා දෙන ලෙස උපදෙස් ලබා දුනි. | කැනීම් ඉංජිනේරු - භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | ජනතාවගේ ගල් හා වැලි අවශ්‍යතාවයන් කඩිනමින් සම්පූර්ණ කරමින් බලපත්‍ර ලබා දීමේ පහසු ක්‍රමවේදයක් දිවයිනටම බලපැවැත්වෙන පරිදි සකස් කිරීමට අතිගරු ජනාධිපතිතුමන්ගේ අවධානය යොමු වී ඇති බවටත්, ඒ සඳහා ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටුවා ඇති බවටත්, මධ්‍යම පරිසර අධිකාරියට හා පතල් කැනීම් කාර්යාංශයට වෙනම පරීක්ෂණාගාර ඉදිකිරීමට කටයුතු කර ඇති බවටත්, ජාවාරම් වැලැක්වීම සඳහා වෙනම වැටලීම් ඒකකයක් ස්ථාපිත කිරීමට කටයුතු යොදා ඇති බවටත් කරුණු ඉදිරිපත් කරන ලද අතර, දිවයිනේ ගංගා සියල්ලම ආරක්ෂා කර ගැනීමේ ව්‍යාපෘතියක් ලෙස සියළුම අමාත්‍යාංශ එකමුතුව කටයුතු කරන බව හා එමඟින් කිරිදි ඔය ද ආවරණය වන බව ප්‍රකාශ කරන ලදි. | | |
| 12.3 | තිස්සමහාරාම මාර්ග දෙපස අනතුරුදායක ගස් ඉවත් කිරීම | මාර්ග දෙපස අනතුරුදායක ගස් පවතින අතර ඒවා කඩිනමින් ඉවත් කිරීම සුදුසු බවට යෝජනා ඉදිරිපත් විය.<br>දැව සංස්ථාව විසින් දැවමය වටිනාකම ඇති ගස් පමණක් ඉවත් කර අනෙකුත් ගස් ඉවත් නොකිරීම ගැටළු සහගත බව ප්‍රකාශ කරන ලදි. | මේ සම්බන්ධයෙන් රාජ්‍ය දැව සංස්ථාව දැනුවත් කිරීම සුදුසු බවට තීරණය කරන ලදි. | සභාපති - තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව / අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| **13** | **වෙනත් ගැටළු** | | | |
| 13.1 | වලස්මුල්ල අතුබෝදේ එච්.සී.ප්‍රියංකර මහතාට නිවාස අධාර ලබා නොදීම | ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස ඉදිකර දීමේ රජයේ වැඩසටහන යටතේ නිවාස සංවර්ධන අධිකාරිය මඟින් තෝරාගෙන පසුව මොහුගේ නම ඉවත් කර ඇති බවට කරුණු දක්වන ලදි. | මේ පිළිබඳව කරුණු සොයා බලා ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - වීරකැටිය<br>දිස්ත්‍රික් කළමණාකරු- නිවාස සංවර්ධන අධිකාරිය |
| 13.2 | අනියම්, ආදේශන, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවාගෙන ඇති සේවකයන් සඳහා ස්ථිර පත්වීම ලබා දීම | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/2019 අනුව අදාල සේවකයන්ට ස්ථිර පත්වීම් ලබා දීමේ හැකියාවක් පැවතුනද, භාණ්ඩාගාර ලේකම්ගේ 2019.11.20 දිනැති ලිපිය හා ප්‍රධාන ලේකම්ගේ 2019.11.21 ලිපිය මඟින් සියළු බඳවාගැනීම් තාවකාලිකව නතර කිරීම හේතුවෙන් එම සේවකයන්ට අසාධාරණයක් සිදු වී ඇති බව දන්වන ලද අතර, එම විධිවිධාන ඉවත් කර ස්ථිර | මේ පිළිබඳ මුදල් අමාත්‍යාංශයෙන් උපදෙස් ලබාගැනීමට තීරණය විය | අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | පත්වීම් ලබාදීම සුදුසු බවට යෝජනා කරන ලදි. | | |

පවතින කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ සෞඛ්‍ය අංශ, ආරක්ෂක අංශ හා අනෙකුත් සියළුම පාර්ශවයන් සාර්ථකව ඊට මුහුණ දීම අගය කළ යුතු බව ප්‍රකාශ කරන ලද අතර, මෙම ව්‍යසනයෙන් රට බේරා ගැනීම සඳහා දිස්ත්‍රික්කයක් ලෙස සියළුම මහජන නියෝජිතයන් හා රාජ්‍ය නිලධාරීන් සාමූහිකව කටයුතු කිරීමේ වැදගත්කම පෙන්වා දෙමින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් කමිටුවේ සියළුම සාමාජිකයන් වෙත ස්තූතිය පලකිරීමෙන් අනතුරුව, ප.ව 1.30ට පමණ රැස්වීමේ කටයුතු අවසන් විය.

ඩබ්ලිව්.එම්. කරුණාරත්න
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

ඩබ්ලිව්. [illegible] ාරත්න
දිස්ත්‍රික් [illegible]
හම්බන්[illegible]

2020 නොවැම්බර් මස ..17......... දින
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.